# අපි වෙමු සිරිලක බොදු දරුවෝ

ඈත අතීතයේ ලංකාවේ අධ්‍යාපනය රඳා පැවතුනේ භික්ෂූන් වහන්සේ මත බව අපි කවුරුත් දනිමු. එක් අතකින් සිංහල භාෂාවත් තවත් අතකින් දහම් අධ්‍යාපනයත් ඉගැන්වීමේ හැකියාවක් භික්ෂුව සතු විය. පන්සලට ගොස් වැල්ලේ අකුරු ලියමින් අකුරු පුරුදු කළ පිරිසක් එදා සමාජයෙහි සිටි බව කවුරු නොදනිත්ද? නමුත් මේ තත්ත්වය වෙනස් වන්නේ විදේශිකයන්ගේ ආක්‍රමණය හේතුවෙනි. ඔවුනටත් අවශ්‍ය වූයේ ගමයි, පන්සලයි, වැවයි, දාගැබයි යන අන්‍යොන්‍ය සම්බන්ධය වෙනස් කිරීමටයි. එයට හේතුව නම් එසේ වූ විට ආක්‍රමණාදී ක්‍රියා පහසුවෙන් සිදු කිරීමට ඔවුනට හැකිවීමයි. කෙසේ හෝ වේවා මෙම තත්ත්වයට ලංකාව අද වන විට වැටී හමාරය. එනිසාම ගමත් පන්සලත් අතර තිබුණු සම්බන්ධය ක්‍රමයෙන් පහත වැටී ඇත. එනිසාම සමාජය එදාට වඩා අද නොයෙක් අයුරින් පිරිහී ඇති බව කවුරුත් දනිති. මේ හේතුව නිසා තමන්ගේ දරුවාට තනිව ගමන් කිරීමටවත් නොහැකි සමාජයක් බිහි වී ඇත. එදා මිනිස්සු මුදල්වලින් ධනවත් නොවුනත් ගුණධර්ම අතින් පොහොසත් වූ පිරිසක් වන්නට ඇති බව නම් පැහැදිලිය. දෙවුන්දරතුඩුවේ සිට පේදුරුතුඩුව දක්වා කාන්තාවකට නිරුපද්‍රිතව පයින් ගමන් කිරීමට හැකියාවක් තිබුණු බව ජනප්‍රවාදයෙහි දැක්වේ. මෙම වැකිය මීට වසර පනසකටත් පෙර රචනා වූ ග්‍රන්ථයන් තුළ පවා දක්වා ඇත්තේ මීට පසර පනසකටත් පෙර ලංකාව පරිහානියට පත්වී ඇති නිසා විය යුතුය. මෙයට මූලිකවම මුළු සමාජයම වගකිව යුතුව ඇත. එයට හේතුව සමාජය යනු තනි පුද්ගලයෙකු නොවන නිසාවෙනි. එබැවින් සමාජය නැවතත් නගා සිටුවීමේ ක්‍රියාවලියක නිරත වීමට නම් පන්සලෙහි පැවති දහම් අධ්‍යාපනය වුව සැමහට අවැසි යුගයක් බවට අද පත් වී ඇත.

දහම්පාසලෙහි අඩුව අද වන විට නොයෙක් අයුරින් දැක ගත හැකිය. බෞද්ධයන් ලෙස පෙනී සිටින බොහෝ දෙනෙකුට බෞද්ධකම යනු කුමක්දැයි වත් තේරුම් ගැනීමේ හැකියාවක් ලැබී නැත. විවිධ වූ දැනුම් මට්ටම් වලින් පොහොසත් වුවත් ගෙදරක සමගිව, නිවැරදිව සිටීමටවත් නොදන්නා සමයක් බවට මේ සමය පත් වී ඇති බව නොරහසකි. පියා තම දියණිය නොහඳුනන සමාජයක් වූයේ ඇයිදැයි අපගෙන්ම විමසිය යුතු කරුණකි. එසේම වැඩිහිටියන්ට සැලකීමක් සිදුවන්නේ අල්ප වූ පිරිසකගෙනි. සුහදව කථාබස් කිරීමේ හැකියාවක් ඇත්තේ ද අල්ප පිරිසකටය. ලංකාවේ මිනිසුන් සමග ලංකාවේ මිනිසුන්ම කථාබස් කිරීමට මහත් බියක් දක්වන බවක් නම් පෙනී යයි. එය විටෙක නිවැරදි වන්නේ ඔවුනගේ ගතිගුණ නොදන්නා නිසාමයි. තවද සමාජයේ ඇති දුර්ගුණ පිළිබඳව අවබෝධයක් ඇති නිසාමයි. ථෙරවාදී බෞද්ධ රටක වාසය කළත් අපගේ පරිහානිය සිදුවන්නේ ඇයිදැයි කිසිවෙක් නොවිමසයි. එයට මූලික හේතුව නම් ගුණධර්මවලට වඩා මුදලට මනස නැඹුරු වීමයි. ධාර්මිකව ධනය රැස් කිරීමෙහි වරදක් නැත. නමුත් අධ්‍යාපනය ලබා ගන්නේ මුදල් රැස් කිරීමේ පරමාර්ථය නිසාවෙන්ම නොවේ. සමාජයේ බුද්ධිමත්කම නගා සිටුවීමටයි. තවද දහම්පාසල් ගියත් නැතත් කම් නැතැයි ඇතැමුන් සිතන්නේ තමන්ගේ දරුවා ධනවතෙකු කිරීමේ අභිලාෂයෙනි. නමුත් පසුකාලීනව දෙමාපියන්ට මහලු නිවාසවල කල්ගෙවීමට සිදුවන විට "අහෝ අපට හොඳ දරුවෙක් සෑදීමට නොහැකි වුනානේ" යනුවෙන් කල්පනා කරති. මේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ දරුවන්ට දහම් අධ්‍යාපනය ලබා නොදීම හේතුවෙන් තමන්ටම පසු තැවීමට සිදු වූ අවස්ථාවකි. ඉරිදා දිනය සාමාන්‍යයෙන් බෞද්ධ දරුවන්ගේ ජීවිතය හැඩීමට උපකාරී වන දිනයක් කළ යුතු වේ. අන්‍යාගමික දරුදැරියන් දහම්පාසැල්වලට ගොස් ඔවුනගේ අධ්‍යාපනය ලබන නමුත් සිංහල බෞද්ධ දරුදැරියන් සියලු දෙනාට එම දහම් අධ්‍යාපනය හිමිවේද?

දහම්පාසල ඇතැමුන්ට අනුව නරක ස්ථානයකි. එහි නිවැරදි අධ්‍යාපනයක් ලබා නොදෙන බව ද පවසති. කෙසේ නමුත් කිවයුතු යමක් ඇත. එනම්, පන්සලකට යන්නේ තමන්ගේ යහපත වෙනුවෙන් බවයි. එතැන මොනයම් වූ තැනක් වුවත් තමන්ගේ සිතෙහි පැහැදීම ඇති නම් අන් අයගේ කම් සිහිපත් කිරීමෙන් ඇති ඵලය කිම? අපගේ වටහීම පරිදි උදෑසන අවදිවන දරුවෝ මල් කඩා රැස් කොට දහම්පාසලට ගොස් පන්සල පවිත්‍ර කිරීම, පඤ්චශීලය සමාදන්වීම, තෙරුවන් වැඳීම, මල් පහන් පූජා කිරීම, දෙවියන්ට සහ මළගිය ඥාතීන්ට පිංදීම, මෛත්‍රීභාවනාව විනාඩියක් පමණ වුව වැඩීම සිදු කරති. මේ තුළින්ම පැහැදිලි වන්නේ පොතපතේ දැනුම නොලැබුණත් යහපත් ක්‍රියාකාරකම් කිරීමට ළමයා

පුරුදුවන බවකි. එසේ නම් ස්ථානය කුමක් වුවත් මෙම වැදගත් ක්‍රියාවෝ දහම්පාසලකදී සිදු කරණු ලැබෙත්. එබැවින් දහම් අධ්‍යාපනය යනු පොතපතට සීමා වූවක් නොවන බව පැහැදිලිය. මෙම ක්‍රියාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා දරුවා ඇතැම් පොහොය දිනයන්හිදී පන්සලට පැමිණ සිල් රකියි; භික්ෂූන් වහන්සේලාට අවනතව ක්‍රියා කිරීමට පෙළඹෙයි. උන්වහන්සේලාගේ උපදෙස් පිළිපැදීමට ක්‍රියා කරයි. එසේම සංවරව හැසිරීමට පුරුදු වෙයි; වැඩිහිටියන්ට සැලකීමට පුරුදු වෙයි; මව්පියන්ට උවටැන් කිරීමට පුරුදු වෙයි; ඔවුනගේ බස් පිළිපදියි; වැරදි ක්‍රියාවලින් වැළකී සිටීමට පෙළඹෙයි; සමාජය පිළිබඳ අවබෝධයක් ලබා ගනියි. එසේ නම් දහම් අධ්‍යාපනය යනු පාලි, අභිධර්මය, සිංහල, ජාතකකථා පමණක් නොවන බව පැහැදිලිය. කොතරම් උගත් වුවත් දෙමාපියන්ට ගරු කිරීමට නොදන්නා දරුවාගෙන් රටට ඇති සෙත කුමක්දැයි විමසිය යුතු නොවේද?. උගත්කම ඕනෑම කෙනෙකුට පොතක් පතක් කියවා ලබා ගත හැකිය. එසේම පොතපත තුළින් ලබා ගන්නා කරුණු මත පිහිටා යහපත් වීමට ද හැකිය. එසේ වන අය ද නොවන අය ද අද සමාජයෙහි සිටිති. එබැවින් පොත්පත් තුළින්ම නොව ක්‍රියාවෙන් ද යහපත් වීම බුදුදහමෙහි අපේක්ෂිත අරමුණයි. සැබවින්ම බුදුදහම යනු පොතපතේ දැනුම නොව යථාවබෝධයයි. යහපත්ව ගුණගරුකව හැසිරෙන්නට හැකිනම් ඒ පුද්ගලයාට දෙවියන්ගේ පවා වැඳුම් පිදුම් ලබා ගත හැකි බව ත්‍රිපිටකයෙන් අනාවරණය කරගත හැකි වේ.

පොහොය දවසකට පන්සලකට ගිය විට පෙනී යන කරුණක් නම් වයසක උපාසක උපාසිකාවන් පමණක් ලංකාවේ බහුල වශයෙන් සිල් ගන්නා බවකි. එයින් පෙනී යන්නේ තමන්ගේ දරුවන්ට දහම් අධ්‍යාපනයක් ලබා දී නොමැති බවක් නොවේද? එසේ ලබා දෙන්නේ නම් තමන්ගේ දරුවන් සමගම පන්සලට ගොස් පොහොය දිනය ගත කළ හැකිය. එහිදී ඔහුට හෝ ඇයට තම ජීවිතයට අදාළ වැදගත් ධර්මකරුණු වේවා යම් යම් ධර්මානුකූල ප්‍රතිපදාවන් වේවා අත්දැකීමට හැකි වෙයි. ඒ තුළින් ඔහු හෝ ඇය තම ජීවිතය හැඩගස්වා ගැනීමට උත්සාහ කරයි. තමන්ම ප්‍රථමයෙන් පිරිසිදු විය යුතු බව බුද්ධදේශනාවයි. එසේ නම් අනුන් කරන දේ පිළිබඳව සිතමින් පසුතැවිලි වෙනවාට වඩා තමන් නිවැරදිව සිටින්නේද යන්න තමන්ගෙන්ම අසා ඒවාට පිළියම් සෙවිය යුතුය. එනිසා තමන්ගේ නිවස තුළ සිටිනා දරුවාටත් දහම් අධ්‍යාපනය ලබා දීම දෙමාපියන්ගේ වගකීමකි. මසකට වරක් හෝ සිල් ගැනීමට ඔවුන් සමග යා යුතුය. එවිට කුඩා අවදියේ සිටම ඔහුගේ සිත දහමට නැඹුරු වෙයි. ඒ අනුව යහපත් සමාජයක් ගොඩ නැගිය හැකිය. එසේ නොමැතිව වයසට ගිය අය පමණක් පොහොය දවසට පන්සලට යන්නේ නම් සමාජයක් යහපත් නොවනු ඇත. එයට හේතුව වන්නේ වයසට ගිය අයගේ ඉඳුරන් සැබවින්ම දුර්වලමය. එසේ දුර්වල වූ සමයක සිල් ගැනීම වරදක් නොවේ. නමුත් සමාජයෙහි ඊළඟ පරම්පරාව දහමට නැඹුරු කොට තැබීම වැඩිහිටියන්ගේ වගකීමකි. එසේ නොවන තැන සමාජයෙන් යහපතක් බලාපොරොත්තු විය නොහැකිය. සමාජය දූෂිත යැයි පවසන්නේ ද මේ සමාජය විසින්ම බැවින් ඒ සඳහා වගකීම මුළු සමාජයම දැරිය යුතුය.

තවද පැවසිය යුතු කරුණක් ඇත. එනම්, දහම්පාසල් ගීතය රචනා කරණ ලද්දේ සෝමපාල රාජකරුණා නමැත්තෙකි. එම ගීතය දහම් පාසලට ගිය දරුවන්ට අමුතුවෙන් කිවයුතු නොවේ. නමුත් එහි අදහස පිළිබඳ සිතන්නේ කිහිපදෙනෙකි. එහි සඳහන් කරුණු අනුව බෞද්ධ දරුවෙකු කෙබඳු පුද්ගලයෙක් ද යන්න මැනවින් වටහා ගත හැකිය. ගීයට පමණක් නොව සැබවින්ම තම ජීවිතයෙහි මෙබඳු ගති ලක්ෂණ ඇත්දැයි සිතිය යුතු කාලයකි මේ, එය විමසිය යුතු කාලයකි මේ. එම ගීතය මෙසේ දැක්වේ.

සම්බුදු හිමිගේ - සදහම් සිසිලෙන්
සැනහෙන අප සිරිලක් දරුවෝ //
දහම් පාසලේ සෙවනෙහි වැඩෙමින්
උදාර ගුණදම් සිත දරුවෝ//

පස්පව්-දස අකුසල් දුරලා
ඉසි - ක්‍රෝ - මන් හැම බිඳ හැරලා
මෙත් - කරුණා - මුදිතාදී මුනිගුණ
සපුරා පිළිවෙත් මඟ සරසා

සොමි උවනින් දුටු දුටුවන් පිනවන
පියතෙපුලෙන් ඇසු ඇසුවන් සනහන
හදබැතියෙන් නිති තෙරුවන් නමදින
උදාර ගුණදම් සිත දූරුවෝ
අපි වෙමු සිරිලක බොදු දරුවෝ///

මෙම ගීතය තුළ අඩංගු ගුණධර්ම සැබවින්ම අප සතුව ඇතිනම් අප තරම් ශ්‍රේෂ්ඨ ජාතියක් තවත් සිටීදැයි ප්‍රශ්න කළ යුතු නොවේ. බොදු දරුවා වනාහි සම්මා සම්බුදුරදුන්ගේ දහම් සිහිලසින් සැනසෙන පුද්ගලයෙකි; එසේම දහම්පාසැලේ සෙවනෙහි වැඩෙන්නෙකි; උදාර වූ ගුණදම් සිතෙහි දරන්නෙකි. පස්පව්වලින් වැළකී සිටින්නෙකි; දස අකුසල් දුරු කරන්නෙකි; ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මානය, බිඳ හෙළන්නෙකි; මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන මුණිගුණයන් සපුරමින් පිළිවෙත් පුරා තම ජීවනමග සරසන්නෙකි; සෞම්‍ය උවනින් (මුහුණින්) දුටු දුටුවන් පිනවන්නෙකි; පියතෙපුල් ප්‍රකාශ කොට අන් අය සනසන්නෙකි. හදවතෙහි භක්තිය දරාගෙන තෙරුවන් නමදින්නෙකි. මෙබඳු වූ උදාර ගුණදහම් සිතෙහි දරණ පිරිසකි සිරිලක බොදු දරුවා යනු. එසේ නම් දහම්පාසලකට දරුවෙකු යොමු කරවිය යුත්තේ මෙබඳු ගුණධර්ම ප්‍රගුණ කිරීම පිණිසයි. ඒ අනුව රටට වැදගත් වූ යහපත් වූ පුද්ගලයෙක් බිහිවෙයි. ඔහුගෙන් අන් අයට කරදරයක් නැත. ඔහුගේ සෑම ක්‍රියාවක්ම යහපත් වෙයි. තමන් පිළිබඳව මෙන්ම අන් අය ගැන සිතීමට තරම් වූ කරුණාබර සිතක් ඔහුට ඇත. මිතුරු බවින් යුක්තව වාසය කරන අතර ඔහුගේ ජීවිතයට සතුරු පක්ෂය ළඟා නොවෙයි. සතුරා වුව මිතුරෙකු කර ගැනීමේ හැකියාවක් ගුණධර්මවලින් හෙබි චරිතයකට හැකිවේ. දෙමව්පියන්ට වන්දනා කිරීමට තම දණහිස් නැමීමට තරම් වූ ශක්තියක් ඔහුට ලැබේ. අන් අයගේ ප්‍රකාශයන්ට නිවැරදි නම් අවනත වීමට හැකි වේ. එසේම වැරදි නම් එය සිත නොරිදෙන අයුරින් ප්‍රකාශ කිරීමේ හැකියාවක් ද ඔහුට හිමි වේ. දයාවෙන් යුක්ත සිතකින් ජීවත් වන ඔහුට යහපත් සමාජය ප්‍රශංසා කරයි. ඔහුගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරයි. ජීවිතයට ගුණධර්ම නැති නම් එම ජීවිතය පිරිහුණු ජීවිතයක් බව දැන ගනියි. ද්වේෂ සහගත සිතකින් යුක්තව විසීම තමන්ට මෙන්ම අන් අයට ද හානිකර යැයි දැන ගනියි. ලෝභ සහගත සිතිවිලි පැමිණියත් ඒවා මැඩ පවත්වා ගනියි. පන්සිල් පිළිබඳ අවබෝධයක් ලබා ගනියි. ඒ අනුව ක්‍රියා කරයි. ඒ තුළින් ජීවිතය සුන්දර වූ ජීවිතයක් බවට පත් කර ගනියි. රටේ යන යන තැන ගෞරවයට පාත්‍ර වෙයි. සද්ධාදී ධනයන්ගෙන් පෝෂිත වූ ජීවිතයක් ඔහු හිමි කර ගනියි. වර්තමානයෙහි සතුටින් සිටීමට උත්සාහ කරයි. ගෙවෙන මොහොතත් ජීවිතයේ එක මොහොතක් ලෙස සිතා එයින් යහපත් පල නෙලා ගැනීමට උත්සාහ කරයි. කම්මැලිකම දුරු කොට ආගම දහමටත්, සමාජයටත්, රටටත් වැඩ ඇති දරුවෙකු ලෙස ජීවත් වෙයි. එබැවින් දරුවාට දහම් අධ්‍යාපනය ලබාදීමත්, ඒ මත සිට තම ජීවිතය සකසා ගැනීමටත් මාවත සැකසීම බෞද්ධ දෙමාපියන්ගේ වගකීමක් නොවේද?

මතුරට පඤ්ඤානන්ද හිමි

විද්‍යෝදය පිරිවෙණ